ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 160/28 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාදා — 1975.04.19

(ආඥාවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

ආණ්ඩුවේ නිවේදන

ජනා. කා. අංකය : ඩබ්ලිව්. 68 (50)/75.

(40 වන අධිකාරය වූ) මහාජන ආරක්ෂක ආඥාපනත

අගමැතිගේ නිර්දේශය අනුව මහාජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලැබූ නියෝග.

වී. ගොපල්ලව,
ජනාධිපතිවරයා.

1975 අප්‍රේල් මස 19 වැනි දින,
නුවරඑළිය දී ය.

නියෝග

1. මෙම නියෝග 1975 අංක 4 දරන හදිසි අවස්ථා (පඩි හා මිමි) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (158 වන අධිකාරය වූ) පඩි හා මිමි ආඥාපනතේ විධිවිධාන සහ ඒ ආඥාපනත යටතේ සාදන ලද කවර නියෝගයක් වුවද නොතකා මෙම නියෝග බල පවත්වන්නේය.

3. ඕනෑම පඩි හා මිමි පරීක්ෂකයකුට හෝ ඕනෑම මිල පාලන පරීක්ෂකයකුට—

(අ) දිවයින තුළ (යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත වූ ඕනෑම ප්‍රදේශයක් ද ඇතුළු) ඕනෑම තැනක් හෝ ඕනෑම ප්‍රදේශයක් තුළ යම් වෙළඳාමක කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන යම් ස්ථානයකට ඇතුළු වී ගැනුම්කරුවකුට බඩු භාරදීමේ කාර්යය සඳහා කරනු ලබන හෝ කරන ලද බඩු කිරීමක් හෝ මැනීමක් පරීක්ෂා කිරීමට ද ;

(ආ) 1971 අංක 7 දරන පනතින් සංශෝධනය කරන ලද පරිදි වූ ආඥාපනතේ 44ආ වන වගන්තිය කඩ කරමින් එසේ භාර දෙන ලද බඩු කිසිවක් එකී 44ආ වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් නඩුවක් පැවරීමක කාර්යයන් සඳහා, අවශ්‍ය විට තහනමට ගෙන රඳවා ගැනීමට ද

බලය ඇත්තේය.

4. දිවයිනේ ඕනෑම කොටසක දී මෙම ආඥාපනත යටතේ වූ යම් නඩුවක් පැවරීම සඳහා අනුමැතිය දීමට සම්මත ප්‍රමාණ භාරකරුට බලය ඇත්තේය.

5. මෙම නියෝගවල—

" ආඥාපනත " යන්නෙන් (158 වන අධිකාරය වූ) පඩි හා මිමි ආඥාපනත අදහස් වේ ;

" පඩි හා මිමි පරීක්ෂක " යන්නෙන් ආඥාපනත යටතේ පත් කරන ලද පඩි හා මිමි පරීක්ෂකයෙක් අදහස් වේ ;

" පළාත් පාලන ආයතන " යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් සහ ගම් සභාවක් අදහස් වන අතර ඊට අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය ද ඇතුළත් වේ ;

" මිල පාලන පරීක්ෂක " යන්නෙන් (173 වන අධිකාරය වූ) මිල පාලන පනත යටතේ පත් කරන ලද මිල පාලන පරීක්ෂකයෙක් අදහස් වේ ;

" සම්මත ප්‍රමාණ භාරකරු " යන්නෙන් ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරන ලද සම්මත ප්‍රමාණ භාරකරු අදහස් වන අතර ඊට නියෝජ්‍ය සම්මත ප්‍රමාණ භාරකරු ද ඇතුළත් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී